# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2100/12 - 2018 දෙසැම්බර් මස 05 වැනි බදාදා - 2018.12.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 (1) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, (2017 සැප්තැම්බර් 29 වන දින අංක 2038/75 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන්වරට සංශෝධිත) එකී පනතේ 21 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය පිහිටුවමින්, නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ ''පීඨය'' යන ශීර්ෂය යටතේ දක්වෙන ''ව්‍යවහාරික විද්‍යා පීඨය'' යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වන තීරයේ ''අධ්‍යයන අංශය'' යන ශීර්ෂය යටතේ දක්වෙන ''ගණිත විද්‍යා අධ්‍යයන අංශය'' යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන්, 1996 මාර්තු මස 27 වන දින අංක 916/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''ඇ. රසායන විද්‍යා අධ්‍යයන අංශය''.

ආචාර්ය විජයදාස රාජපක්ෂ,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

12 - 501


1A - PG 4330 — 508 (2018/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*